" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01 — SLSI ISO 9001

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

General Telephone } 011 - 2093000

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / My No. | CSWP/ADM/30-38/FI/01(2025) | ඔබේ අංකය / Your No. | | දිනය / Date | 2025.04.09 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපිය බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.04.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | චක්‍රලේඛ / චක්‍රලේඛ ලිපි අංකය හා දිනය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2025 හා 2025.04.02 | රාජ්‍ය ආයතන වල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම. |
| 02. | අ.දූ.චෝ.වි.කො.ස. චක්‍රලේඛ 01/2025 හා 2025.03.27 | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 03/2025 හා 2025.04.07 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවීම |

02. මෙම චක්‍රලේඛයන්හි හා චක්‍රලේඛ ලිපියෙහි පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ/ චක්‍රලේඛ ලිපි පරිදි කටයුතු කරන ලෙස කාර්යාලයේ ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා ඩී. සපරමාදු,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092608
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2025

මගේ අංකය : EST-5/04/PCY/0041
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2025.04.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවීම

2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීමට අදාළව නිකුත් කරන ලද 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. 2025 අප්‍රේල් මස වැටුප, උක්ත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගෙවිය යුතුව ඇත.

03. රජයේ නිලධරයන්ට ගෙවිය යුතු අප්‍රේල් මස වැටුප එම මස 10 වන දින ගෙවීමට කටයුතු කළ යුතු නමුත්, කිසියම් පිළිගත හැකි හේතුවක් මත එදිනට ඉහත සඳහන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සංශෝධිත වැටුප සිය කාර්යමණ්ඩලය සඳහා ගෙවීමට අපොහොසත් වුවහොත්, 2025.04.10 දින ඔවුන්ට දැනට හිමි වැටුප ගෙවිය යුතු අතර නව වැටුප් පරිවර්තන සිදු කිරීමෙන් අනතුරුව අප්‍රේල් මාසය සඳහා ගෙවිය යුතු වැටුපෙහි හිඟ මුදල 2025.04.25 දින ගෙවීමට ක්‍රියාකළ යුතු ය.


එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk